**එයාර්පෝට් ඇන්ඩ් ඒවියේෂන් සර්විසස් (ශ්‍රී ලංකා) ලිමිටඩ් සමාගම -2015**

**-----------------------------------------------------------------------------------**

2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා එයාර්පෝට් ඇන්ඩ් ඒවියේෂන් සර්විසස් (ශ්‍රී ලංකා) ලිමිටඩ් සමාගමේ ("සමාගම")මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මෙම විගණනය කරගෙන යාමේදී ප්‍රසිද්ධ වෘත්තියෙහි නියැලි වරලත් ගණකාධිකාරී සමාගමක් මට සහාය විය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**---------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ("මණ්ඩලය") වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**2. මූල්‍ය ප්‍රකාශන**

------------------

**2.1 තත්වාගණනය කළ මතය**

-----------------------------

තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් ඇතිවන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින්, 2015 දෙසැම්බර් 31 දිනට එයාර්පෝට් ඇන්ඩ් ඒවියේෂන් සර්විසස් (ශ්‍රී ලංකා) ලිමිටඩ් සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---------------------------------------------

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි 2015 දෙසැම්බර් 31 දිනට රු.26,564,560,367 ක ධාරණ අගයක් සහිත මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපළට (MRIA)අදාළ දේපල, පිරියත හා උපකරණ ඇතුළත් වේ. ආරම්භයේ සිට මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපළෙහි මෙහෙයුම් පහළ වැටෙමින් තිබූ අතර 2015 ජනවාරි මාසයේ 2620 ක් වූ මගී සංචලනය 2016 මැයි මාසයේදී 349 ක් දක්වා පහළ බසිමින් දැනට මගීන් සහිත ගුවන් සේවා 2 කට ගුවන් ගමන් සීමා වී ඇත. නුදුරු අනාගතයේදී උපලබ්ධි වීම සඳහා අපේක්ෂා කළ නොහැකි මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපළෙහි ආර්ථික කාර්ය සාධනය මෙම වාර්තාවේ දිනයට පිරිහීම හේතුවෙන් ශ්‍රීලංගිප්‍ර 36, වත්කම් හානිකරණය පිළිබඳ ප්‍රමිතියට අනුකූලව ඒවා හානිකරණය සඳහා දර්ශකයන් ලෙසට මම සලකමි. කෙසේ වුවද මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපළ වෙනම මුදල් උත්පාදන ඒකකයක් යන පදනම මත එය හානිකරණය වේද යන්න සඳහා යම් හැඟවීමක් තිබේද යන්න පරීක්ෂා කිරීම සඳහා හානිකරණ තක්සේරුවක් කළමනාකරණය විසින් සිදු කර නොතිබුණි. ඒ අනුව 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වාර්තා කර ඇති මුදල් ප්‍රමාණයන් සඳහා යම් හානිකරණ ලියා හැරීමක් අදාළ වේද යන්න තීරණය කර ගැනීම සඳහා හානිකරණ පරීක්ෂාවක් සිදු කර නොතිබුණි. මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපළෙහි දේපල, පිරියත හා උපකරණ පිළිබඳ අය කර ගත හැකි ප්‍රමාණය තක්සේරු කිරීම සඳහා තොරතුරු නොමැතිවීමෙන් 2015 දෙසැම්බර් 31 දිනට එම දේපල, පිරියත හා උපකරණවල ධාරණ අගය පිළිබඳව මට සෑහීමකට පත්විය නොහැකි විය.

**2.3 ගිණුම්කරණ අඩුපාඩු**

------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) සම්පූර්ණ කරන ලද ඉදිකිරීම් 3 ක් උපයෝජනය කරමින් පැවතුණද, එම වත්කම්වලට අදාළ රු. මිලියන 43.5 ක මුළු පිරිවැය ප්‍රාග්ධනිත කර ස්ථාවර වත්කම් ලේඛනයේ සටහන් කර නොතිබුණි. තවද ඒ සඳහා රු. මිලියන 3.5 ක ක්ෂය ප්‍රතිපාදනය සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල සිදු කර නොතිබුණි.

(ආ) රු. මිලියන 59 ක් වටිනා විෂයයන් 3 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් සමාගමට ලැබී පරිශ්‍රයේ භෞතිකව පැවතියද එම විෂයයන් මාර්ගස්ථ බඩු ගිණුමේ ඇතුළත් කර තිබුණි.

(ඇ) කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කිරීමෙන් පසුව, ජර්නල් සටහන් 145 ක් මගින් රු. මිලියන 6,676 ක් වටිනා ගැලපීම් සිදු කර තිබුණි. එබැවින් නියැදියට බාහිරව තවදුරටත් අඩුපාඩු හා/හෝ ගැලපීම් පැවතීමේ හැකියාව විගණනයේදී බැහැර කළ නොහැකි විය.

## 2.4 ගෙවිය යුතු ගිණුම්

--------------------

එකතුව රු. මිලියන 13 ක් වූ ගෙවිය යුතු ශේෂ සමාලෝචිත වර්ෂය අවසානයට වර්ෂ එකකට වැඩි කාලයක් හිඟ හිට පැවතුණි. කෙසේ වුවද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ඒවා නිරවුල් කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

## 2.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

----------------------------------------------------------------------------

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2007 අංක 07 දරන සමාගම් පනතේ 6 වගන්තිය | නව සමාගම් පනත යටතේ යළි ලියා පදිංචි කිරීමෙන් පසුව පොදු ලියකියවිලිවල සමාගමෙහි නමට "(ප්‍රයිවෙට්) ලිමිටඩ්" හෝ කෙටිකර "(පීවීටී) ලිමිටඩ්" යනුවෙන් එකතු කර සමාගමෙහි නම ප්‍රසිද්ධ කළ යුතුය. එහෙත් සමාගම මෙම අවශ්‍යතාවයට අනුකූල වී නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 395 (ඇ) | බැංකු සැසඳුම් ප්‍රකාශන ඊළඟ මාසයේ 15 දිනට පෙර පිළියෙල කළ යුතුය. කෙසේ වුවද, බැංකු ගිණුම් 10 කට අදාළව එසේ කටයුතු කර නොතිබුණි. |
| (ඇ) 2006 අප්‍රේල් 28 දිනැති අංක පීඊ/සීඕඑම්සී/33/02 දරන භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ලිපිය | - රජය සතු ඉඩම් හා ගොඩනැගිලි, වෙනත් චංචල හා නිශ්චල වත්කම් අගය කර නොතිබුණි.<br>- සමාගම වෙත මාරු කරන ලද ශුද්ධ වත්කම් සඳහා ශ්‍රී ලංකා රජයට කොටස් නිකුත් කර නොතිබුණි. |
| (ඈ) යහපාලනය සඳහා රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශ පිළිබඳ 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | |

| | | |
|---|---|---|
| (i) | 7.4.5 වගන්තිය | වත්කම් සත්‍යාපනය සිදු කිරීම සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල හා විශේෂ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල පත් කර නොතිබුණි. |
| (ii) | 9.2 (ඇ) වගන්තිය | සමාගමේ සංවිධාන සටහන හා අනුමත සේවක සංඛ්‍යාව මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර නොතිබුණි. |
| (iii) | 9.3.1 (එ) වගන්තිය | මහා භාණ්ඩාගාරයේ එකඟත්වය සහිතව සමාගමේ බඳවා ගැනීම් හා උසස්වීම් පරිපාටිය (SOR) අදාල අමාත්‍යාංශය විසින් අනුමත කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඉ) | 2015 මැයි 07 දින පවත්වන ලද රැස්වීමේ සටහන් - විෂයය (ඇ) | රු. මිලියන 10 ක් ඉක්මවන සියලු ජර්නල් සටහන් ඒවා ක්‍රමවත් කිරීමට පෙර මූල්‍ය ප්‍රධානී විසින් අනුමත කළ යුතුය. කෙසේ වුවද, රු.1,334,050,000 ක සමුච්චිත වටිනාකමක් සහිත රු. මිලියන 10 ක් ඉක්මවන ජර්නල් වවුචර් 4 ක් අදාළ නිලධාරියා විසින් අනුමත කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ සමාගමේ මෙහෙයුම්වලින් රු. 816,855,571 ක බදු පූර්ව ශුද්ධ ලාභයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ බදු පූර්ව ශුද්ධ ලාභය රු.3,411,715,156 ක් වූයෙන් සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලයේ රු. 2,594,859,585 ක පිරිහීමක් දැක්වුණි. සමාලෝචිත වර්ෂය සඳහා දරන ලද රු. 3,525,237,920 ක් වූ මූල්‍ය කාර්යයන් සඳහා විනිමය පාඩුව මූල්‍ය ප්‍රතිඵලයේ මෙම පිරිහීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 3.2 අගය එකතු කිරීම

සමාගමේ අගය එකතු කිරීම 2011 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා ක්‍රමයෙන් වැඩි වී තිබුණි. කෙසේ වුවද ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 17 ක අඩුවීමක් වූ රු.මිලියන 2,389 කින් එය සමාලෝචිත වර්ෂයේ දී අඩු වී තිබුණි. ( ඇමුණුම බලන්න.)

විනිමය පාඩුව බලපෑම ඉවත් කළේ නම් මුළු අගය එකතු කිරීම 2014 වර්ෂයට සාපේක්ෂව රු. මිලියන 2,155 කින් වැඩි වන බව සභාපතිවරයා විසින් මා වෙත දන්වා තිබුණි.

## 3.3 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

### 3.3.1. වැදගත් ගිණුම්කරණ අනුපාත

ලබා ගත හැකි වූ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක් සඳහා සමාගමේ වැදගත් ගිණුම්කරණ අනුපාත කිහිපයක් පහත දැක්වේ.

| | 2015 | 2014 | 2013 | 2012 | 2011 |
|---|---|---|---|---|---|
| ජංගම වත්කම් අනුපාතය (වාර ගණන) | 2.09 | 1.95 | 1.29 | 1.79 | 2.65 |
| එක් සේවකයෙකුට වත්කම් (රු.'000) | 16,865 | 15,105 | 15,316 | 14,378 | 10,972 |
| එක් සේවකයෙකුට සේවක පිරිවැය (රු.'000) | 1,417 | 1,088 | 1,135 | 1,020 | 942 |
| එක් සේවකයෙකුට ගුවන් යානා සංචලනය (වාර ගණන) | 15 | 14 | 14 | 14 | 13 |
| එක් සේවකයෙකුට මගීන් සංඛ්‍යාව | 2,197 | 1,979 | 1,995 | 2,055 | 1,859 |
| බඩු පැටවීම - එක් සේවකයෙකුට (මෙට්‍රික් ටොන්) | 57 | 53 | 52 | 54 | 51 |
| එක් එක් බඩු පැටවීමට ශුද්ධ මෙහෙයුම් පිරිවැය (රු.'000) | 237 | 171 | 177 | 146 | 176 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රති මිලදී ගැනුම් ගිවිසුම් යටතේ භාණ්ඩාගාර බිල්පත්‍රවල ආයෝජනයන් සියයට 76 කින් වැඩිවීම, ජංගම අනුපාතය වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ එක් එක් බඩු පැටවීමක් සඳහා ශුද්ධ මෙහෙයුම් පිරිවැය සියයට 39 කින් වැඩි වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

සමාගමේ දිගුකාලීන සංස්ථාපිත අරමුණු පහත දැක්වේ.

(i) මුළු මගීන් සංඛ්‍යාවට සංක්‍රමණය (Transit) වන මගීන් සංඛ්‍යාව 1:7 ක් වන පවත්නා අනුපාතය 2018 වර්ෂයේදී 1.5 ක් දක්වා වැඩි කිරීම මගින් ආසියානු කලාපයේ මගී සංක්‍රමණ කේන්ද්‍රයක් ලෙස බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ (BIA) ක්‍රියාත්මක කිරීම.

(ii) 2019 වර්ෂය වන විට මගීන් සංඛ්‍යාව මිලියන 15 ක් සඳහා කටයුතු කිරීමට අවශ්‍ය වන යටිතල පහසුකම් ධාරිතාවය ස්ථාපිත කිරීම.

(iii) බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළට (BIA) ගොඩබස්වන ගුවන්යානා සඳහා සේවා පිරිවැය ප්‍රතිපාදන 2015 වර්ෂයේ සිට 2018 වර්ෂය වන විට සියයට 10 කින් අඩු කිරීම.

(iv) 2018 වර්ෂය වන විට මගීන් සංඛ්‍යාව මිලියන 10 ක් දක්වා වැඩි කිරීම.

(v) 2017 වර්ෂය වන විට මුළු ගුවන් නැව් බඩු ප්‍රමාණයෙන් ගුවන් නැව් බඩු ප්‍රවාහනය මාරු කිරීම (trans – shipment) සියයට 40 ක් ඉටුකර ගැනීම.

(vi) 2017 වර්ෂය අවසානය වන විට අවම වශයෙන් එජඩො මිලියන 0.5 උපයා ගනිමින් තර්කාන්විත ස්වයං ධාරිත සිවිල් ගුවන් සේවා පුහුණු මධ්‍යස්ථානයක් බවට පත් වීම.

(vii) කලාපයේ ශ්‍රේණිගත වීමේ දී ගුවන් තොටුපළ කාර්යසාධනය ඉහළයාමේ ප්‍රවණතාවයක පවත්වා ගැනීම.

(viii) ගුවන්යානා සිද්ධි උදෙසා අඩු ප්‍රවණතාවයක දායකත්වයක් පවත්වා ගැනීම.

(ix) ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානයේ (ICAO) 8973 ලියවිල්ලේ දක්වා ඇති ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා පිළිබඳ ආරක්ෂාව තහවුරු කර ගැනීම.

(x) ආයතනික පාලක පුවරුවේ ගනුදෙනුකරු යථාදර්ශය සඳහා මෙන්ම මූල්‍ය යථාදර්ශය සඳහාද සියයට 20 ක අවම සංඛ්‍යාවක් පවත්වා ගැනීම මගින් සියලුම ගුවන් තොටුපළ පාර්ශවකරුවන් සමග සේවය, වටිනාකම හා මෙහෙයුම් කාර්යක්ෂමතාවය දිගටම සිදු කර ගෙන යාම.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉහත ආයතනික අරමුණු (ප්‍රධාන මෙහෙයුම්) ඉටුකර ගැනීම සම්බන්ධයෙන් භෞතික කාර්යසාධනය පහත දැක්වේ.

| කාර්ය සාධන දර්ශකය | 2015 | 2014 | 2013 | 2012 | 2011 |
|---|---|---|---|---|---|
| ජාත්‍යන්තර ගුවන්යානා සංචලනයන් සංඛ්‍යාව | 56,156 | 54,960 | 51,972 | 48,416 | 43,454 |
| ගුවන් මගීන් සංචලනයන් සංඛ්‍යාව | 8,505,740 | 7,780,724 | 7,330,421 | 7,079,920 | 6,145,532 |
| ගුවන් නැව්බඩු සංචලනයන් සංඛ්‍යාව (මෙට්රික් ටොන්) | 220,422 | 209,607 | 194,020 | 186,618 | 168,577 |

(i) ඉකුත් වර්ෂ 5 ක කාලය තුළ ජාත්‍යන්තර ගුවන්යානා සංචලනයන් සංඛ්‍යාව ක්‍රමයෙන් වැඩි වී තිබුණද, වැඩි වීමේ ප්‍රවණතාවය 2011 වර්ෂයේ සියයට 27.5 සිට 2015 වර්ෂයේ සියයට 2.2 දක්වා අඩු වී තිබුණි.

(ii) ගුවන් මගීන් සංඛ්‍යාව 2011 සිට 2015 වර්ෂය දක්වා බොහෝ ලෙස වැඩි වී තිබුණි. කෙසේවුවද වැඩිවීමේ ප්‍රවණතාවය 2011 සිට 2013 වර්ෂය දක්වා අඩු වී තිබූ අතර 2013 සිට 2015 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුළ මෙම ප්‍රවණතාවයේ ආන්තික වැඩිවීමක් විය. මේ අතර ගුවන් නැව්බඩු සංචලනයන් සමාලෝචිත වර්ෂය තුළදී සියයට 2.8 කින් අඩු වී තිබුණි.

(ආ) එජඩො මිලියන 190 ක විදේශ ණය මුදලක් යටතේ ඉදිකරන ලද මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළ (MRIA) පිළිබඳ කාර්ය සාධනය පහත දැක්වේ.

| කාර්යසාධන දර්ශකය | 2015 | 2014 | 2013 |
|---|---|---|---|
| ගුවන් මගීන් සංචලනයන් සංඛ්‍යාව | 6,291 | 40,386 | 36,137 |
| ජාත්‍යන්තර ගුවන්යානා සංචලනයන් සංඛ්‍යාව | 1,044 | 2,890 | 1,451 |
| නැව්බඩු සංචලනයන් (මෙට්රික් ටොන්) | 19 | 221.9 | 64 |
| මුළු ආදායම (රු.) | 71,430,816 | 136,264,763 | 48,010,898 |
| මුළු මෙහෙයුම් වියදම (රු.) | 2,288,694,851 | 2,228,465,247 | 1,776,140,280 |
| මෙහෙයුම් පාඩුව (රු.) | 2,217,264,035 | 2,092,200,483 | 1,728,129,382 |
| මූල්‍ය වියදම (රු.) | 881,966,545 | 637,001,196 | 377,169,000 |
| ශුද්ධ පාඩුව (රු.) | 3,099,230,580 | 2,729,201,680 | 2,105,298,382 |

ඒ අනුව, මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළේ (MRIA) කාර්ය සාධනය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළ දී දැඩි ලෙස පිරිහීමට ලක් වී තිබුණි.

## 4.2 කළමනාකරණ දුර්වලතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපාර සම්පත් සැලසුම් (ERP) පද්ධතියක් ක්‍රියාත්මක කිරීම සඳහා කොන්ත්‍රාත්තුව මාස 08 ක කාල පරිච්ඡේදයක් තුළ නිම කිරීම සඳහා රු. මිලියන 248.6 ක මුදලකට 2012 ජූනි 29 දින පුද්ගලික සමාගමකට ප්‍රදානය කර තිබුණි. සමාගම විසින් රු. 27,464,632 ක මුදලක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබූ අතර, කොන්ත්‍රාත් කාල පරිච්ඡේදයද අවස්ථා 4 කදී දීර්ඝ කර තිබුණි. කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර වර්ෂ 04 කට වැඩි කාලපරිච්ඡේදයක් ඉකුත් වී තිබුණද, නියමිත පරිදි ව්‍යාපෘතිය නිම කිරීමට 2016 ඔක්තෝබර් 31 වන විටත් කොන්ත්‍රාත්කරු අපොහොසත් වී තිබුණි.

(ආ) 2002 වර්ෂයේදී රු. මිලියන 5.6 ක ගෙවීමක් හා 2003 වර්ෂයේදී රු. මිලියන 1.4 ක ගෙවීමක් ඇතුළු රු. මිලියන 7 ක මුදලක් වැය කර පුද්ගලික පාර්ශවයකින් ඉඩමක් මිලදී ගෙන තිබුණි. මෙම ඉඩම රජය සතු එකක් බව කතරගම ප්‍රාදේශීය ලේකම්, විසින් පසුව දන්වා තිබුණි. ඉන්පසු මෙම ඉඩම රු.460,000 ක වාර්ෂික බදු කුලියකට 2008 ජනවාරි 10 දින සිට බලපැවැත්වෙන පරිදි

වර්ෂ 30 ක් සඳහා කුලී පදනම මත ලබා ගෙන තිබුණි. එසේ වුවද, 2002 හා 2003 වර්ෂවලදී පුද්ගලික පාර්ශවයට ගෙවන ලද රු. මිලියන 7 ක මුදල අයකර ගැනීමට සමාගමට නොහැකි වී තිබුණි. තවද මෙම මුදල අය කර ගැනීම අවිනිශ්චිතව පැවතුණි.

**4.3 මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නියෝජ්‍ය අංශ ප්‍රධානී තනතුරු 4 ක් සඳහා ස්ථිරව පත් කිරීමට කටයුතු කිරීමෙන් තොරව 2016 මැයි 10 දක්වා වර්ෂ 01 සිට වර්ෂ 05 ක කාල පරිච්ඡේදයක් සඳහා අංශ ප්‍රධානී තනතුරු වලට වැඩ බැලීමේ පදනම මත පත්කර තිබුණි.

(ආ) රේඛීය අමාත්‍යාංශයෙන් හා මහා භාණ්ඩාගාරයෙන් අනුමැතිය ලබා ගැනීමෙන් තොරව 2011 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා රු. 942,000 සිට රු.1,417,000 දක්වා එක් සේවකයෙකුට සේවක පිරිවැය වැඩි කර තිබුණි.

**5. පද්ධති හා පාලන**

-------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු සමාගමේ සභාපතිගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුවේ.

| | පාලන ක්ෂේත්‍රය | | නිරීක්ෂණ |
|---|---|---|---|
| | ----------------- | | ----------- |
| (අ) | මානව සම්පත් කළමනාකරණය | - | මහා භාණ්ඩාගාරයේ එකඟත්වය සහිතව අදාළ අමාත්‍යාංශය විසින් සේවක සංඛ්‍යාව හා බඳවා ගැනීම් පරිපාටිය අනුමත කර නොතිබුණි. |
| (ආ) | ගිණුම්කරණය | - | සමාගමේ සමස්ත විස්තරාත්මක ගිණුම්කරණ පද්ධතියක් නොතිබුණි. |
| (ඇ) | ලැබිය යුතු හා ගෙවිය යුතු මුදල් | - | ගිණුම්වල දිගු කාලීන හිඟ ශේෂයන් පැහැදිලි කර ගැනීමෙන් හෝ/සහ නිරවුල් කිරීමෙන් තොරව පැවතුණි. |
| (ඈ) | වත්කම් කළමනාකරණය | - | භාණ්ඩ සමීක්ෂණය හා වත්කම් තක්සේරු කිරීම සිදු කර නොතිබුණි. |

ඇමුණුම

විස්තරය

| | 2015 (රු. මිලියන) | 2014 (රු. මිලියන) | 2013 (රු. මිලියන) | 2012 (රු. මිලියන) | 2011 (රු. මිලියන) |
|---|---|---|---|---|---|
| බදු වලට පසු ලාභය (ලාභාංශ ගෙවීමට පෙර) | 817 | 3,412 | 3,554 | 2,738 | 1,389 |
| එකතු කළා - | | | | | |
| සේවක පාරිශ්‍රමික | 5,658 | 4,729 | 4,170 | 3,515 | 3,114 |
| රජයට ගෙවන ලද ලාභාංශ | 350 | 497 | 750 | 795 | 1,009 |
| රජයට ගෙවන ලද බදු | | | | | |
| - ආදායම් බදු | 1,561 | 2,211 | 1,192 | 1,121 | 751 |
| - පිරිවැටුම් බදු/ජාතිය ගොඩනැගීමේ බදු | - | - | - | - | 19 |
| - රේගු බදු | 36 | 34 | 45 | 117 | 66 |
| - එකතු කළ අගය මත බදු | 579 | 504 | 409 | 403 | 412 |
| වෙනත් බදු | 39 | 39 | 19 | 19 | 19 |
| ක්ෂය | 2,630 | 2,633 | 1,751 | 1,011 | 1,135 |
| අගය එකතු කිරීම් එකතුව | 11,670 | 14,059 | 11,890 | 9,719 | 7,914 |